# (CFCS) Cerebral Palsy සෙරිබ්‍රල් පෝල්සි (මස්තිෂ්ක ආඝාතය) සහිත පුද්ගලයින් සඳහා වූ සන්නිවේදන ක්‍රියාවලිය වර්ගීකරණ පද්ධතිය

## අරමුණ

CFCS හි අරමුණ වන්නේ Cerebral Palsy (මස්තිෂ්ක ආඝාතය) සහිත පුද්ගලයන් ඔවුන්ගේ දෛනික සන්නිවේදන ක්‍රියාකාරිත්වය අනුව මට්ටම් පහකට වර්ගීකරණය කිරීමයි. CFCS මේ සඳහා සම්පූර්ණයෙන්ම පදනම් කරගනු ලබන්නේ, ක්‍රියාකාරිත්වය, ආබාධිත තත්වය සහ සෞඛ්‍ය (ICF) පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් සම්පාදිත ජාත්‍යන්තර වර්ගීකරණයේ සඳහන් වන, ක්‍රියාකාරිත්වය සහ සහභාගිත්වය පිලිබඳ විස්තරයට අනුවය.

## භාවිතයට උපදෙස්

සන්නිවේදන හැකියා මට්ටම තෝරා ගනු ලබන්නේ එම තැනැත්තා සමග සන්නිවේදන කටයුතු කර පුරුදු දෙමාපිය, රැකබලාගන්නා අයකු සහ/හෝ වෘත්තිය මට්ටමේ කෙනෙකු විසින්ය. මස්තිෂ්ක ආඝාතය (cerebral palsy- සහිත වැඩිහිටි හෝ නව යොවුන් වියේ පසුවන්නෙකුට තමන්ගේ සන්නිවේදන හැකියා මට්ටම මැන වර්ගීකරණය කර ගැනීමටද හැකිය. සන්නිවේදන හැකියාවේ සමස්ත සාර්ථකත්වය පදනම් විය යුත්තේ, ඔවුන් දෛනික ජීවිතයේ අවශ්‍යතා සමග සන්නිවේදනයේ යෙදෙන්නේ කෙසේද යන්න මතය. ඔවුන්ගේ උපරිම හැකියා ධාරිතාවය මත එය පදනම් නොවිය යුතුය. මේ දෛනික සන්නිවේදන සිද්ධින් නිවාස තුල, පාසල තුල හෝ සමාජීය පරිසරය තුල ඇති විය හැකිය.

සමහරක් සන්නිවේදන කටයුතු වර්ගීකරණය කිරීම අපහසු විය හැකියි. එනම්, යම් පුද්ගලයකුගේ හැකියාව මට්ටම් කිහිපයක් අතරේ පැතිරී යා හැකිය. එවන් අවස්ථා වල එම පුද්ගලයා සාමාන්‍යයෙන් බොහෝ අවස්ථාවල දක්වන හැකියාව සලකා ඒ අනුව සුදුසු මට්ටම තීරනය කල යුතුයි. පුද්ගලයාගේ හැකියාව පිලිබඳ කලින් එලඹ ගත් මතයක් අනුව හෝ ඔහු තුල ඇති උනන්දුව සලකා බලා මට්ටම තීරණය නොකළ යුතුය.

## නිර්වචනය

**සන්නිවේදනය** හට ගන්නේ පණිවිඩය **නිකුත් කරන්නා** (sender) විසින් පණිවිඩයක් සම්ප්‍රේෂණය/නිකුත් කල විට <u>සහ</u> පණිවිඩ **ලාභියා / ග්‍රාහකයා** (receiver) විසින් පණිවිඩය තේරුම් ගත් විටය. දෙබසක් සිදුවන විට එහි අවශ්‍යතාවය කුමන පසුබිමක සිදු වුවද (උදා : සමාජීය පරිසරය, පාසල, වැඩපල, නිවස) කතාබස් කරන සගයා කවරකු වුවද, මාතෘකාව කුමක් වුවද, සාර්ථක සන්නිවේදකයකුට ස්වාධිනව, **පණිවිඩ නිකුත් කරන්නා** හා **පණිවිඩ** ලාභියා යන භූමිකා දෙකම ඉටුකළ හැකිය.

CFCS මට්ටම තිරණය කිරීමේදි **සන්නිවේදන ක්‍රියාකාරීත්වයේ සියලු ක්‍රමවේදයන්හි නිපුනතාව** සලකා බලනු ලබයි. කථනය, හස්ත මුද්‍රා (gestures), හැසිරීම් රටා, නෙත් යොමුකිරීම, මුහුණේ හැඟීම් ප්‍රකාශනය සහ වර්ධිත හා විකල්ප සන්නිවේදනය **(Augmentativ and Alternative Communication-AAC)** යන සියල්ල මෙයට ඇතුලත්ය. AAC පද්ධතියට අයත් වන්නේ (මේවාට පමණක් සීමා වන්නේ නැත) හස්ත සංඥා, පින්තූර, සන්නිවේදන පුවරු, සන්නිවේදන පොත්, කතා කිරීමට භාවිතා කරන උපකරණ නැතහොත් හඬ පිටකරන සන්නිවේදන උපකාරක (VOCAs) හෝ කථනය ජනනය කරන උපකරණ (SGDs).

**හැකියා මට්ටම් අතර පරතරයට** පදනම් වන්නේ පණිවිඩ **නිකුත්කරන්නා** හා **ලාභියා** යන **භූමිකාවල** ක්‍රියාකාරිත්වයට දක්වන නිපුනතාව මත හා **සන්නිවේදන වේගය** සහ **කතාබහේ නිරත** වන සගයාගේ **ස්වභාවය** මතය. වර්ගීකරණ පද්ධතිය භාවිතයේදි පහත සඳහන් නිර්වචන සිහියේ තබාගත යුතුය.

**දක්ෂ පණිවිඩ නිකුත්කරන්නන් සහ ලාභීන් පණිවිඩ සම්ප්‍රේෂණය / නිකුත් කිරිමේ ක්‍රියාව** හා ලැබෙන පණිවිඩ අවබෝධ කරගැනීමේ ක්‍රියාව අතර ක්ෂණිකව සහ පහසුවෙන් මාරුවේ. දක්ෂ පණිවිඩ නිකුත් කරන්නන් හා ලාභීන් විසින් පණිවිඩය පැහැදිලි කර ගැනිම සඳහා හෝ වැරදි වැටහීම් දුරු කර ගැනිම සඳහා පණිවිඩය නැවත ප්‍රකාශ කිරීම, වෙනත් වචන වලින් කිම, සරලකොට කිම හෝ වඩා සවිස්තරාත්මකව කිම වැනි උපක්‍රම භාවිත කිරිමට හෝ ඉල්ලා සිටීමට හැකිය. වඩා දක්ෂ පණිවිඩ නිකුත් කරන්නෙකු විසින් සන්නිවේදන හුවමාරුව වේගවත් කිරිම සඳහා, විශේෂයෙන් AAC භාවිතා කිරීමේදී, සමහරක් වචන කෙටි කිරීමෙන් හෝ හැලීමෙන් ව්‍යාකරණ නිවැරදි එහෙත් වඩා අවස්ථානෝචිත ක්‍රමවේදයක්, තමන්ට හුරුපුරුදු වූ සන්නිවේදන සගයන් (communication partner) සමග භාවිතා කල හැක.

සන්නිවේදනයේ **පහසු වේගයක්** යනුවෙන් හැඳින්වෙන්නේ කෙතරම් ඉක්මනින් හා ලෙහෙසියෙන් යමෙකුට පණිවිඩය වැටහේද, ඔහු පෙරලා ප්‍රතිචාර දක්වයිද යන්නයි. වඩා පහසු වේගයක් ඇතිවන්නේ, සන්නිවේදනය අඩපනවන අවස්ථා අවම කොට සහ සන්නිවේදනය කරන වාර අතර විරාම කෙටිවීමෙනි.

**නුපුරුදු සන්නිවේදන කතා සගයන්** යනු ආගන්තුකයන් හෝ නිතර එම පුද්ගලයා සමග සන්නිවේදන කටයුතු වල නිරත නොවන කෙනෙකුය .

**සුපුරුදු සන්නිවේදන කතා සගයන්** හෙවත් නෑදැයින්, රැකබලාගන්නන් හා මිතුරන්ට එම පුද්ගලින් සමග වඩා සාර්ථකව සන්නිවේදනය කිරිමට පෙර දැනුම හා පෞද්ගලික අත්දැකීම් උපකාරී විය හැකිය.

# පැහැදිලි කිරීම්

★ CFCS මට්ටම තහවුරු කර ගැනීම සඳහා **පරීක්ෂණයක් කිරීම අවශ්‍ය නැත**. මෙය ප්‍රමතිගත සන්නිවේදන තත්ත්ව පරීක්ෂනයකට විකල්පයක්ද නොවේ. CFCS යනු පරීක්ෂණයක් නොවේ.

★ CFCS විසින් **පිරිසක් කණ්ඩායම් වලට බෙදනුයේ** ඔවුන්ගේ දැනට පවතින සන්නිවේදන හැකියාවේ **සාර්ථකත්වය** අනුවය. එයින් එම සාර්ථකත්වයට බලපාන හේතූන් දිරිගැන්වීමේ සාධකයන්, බුද්ධිමය, ශාරීරික, කථන හා ශ්‍රවන හැකියාවන් සහ/හෝ භාෂාව පිලිබඳ ප්‍රශ්න ගැන **පැහැදිලි කිරීමක් සිදු නොකරයි.**

★ CFCS මගින් **පුද්ගලයකු තුල තව දුරටත් වැඩිදියුණු වීමට ඇති හැකියාව මැන බැලීමක් නොකරයි**.

★ **පර්යේෂණ කටයුතු වලදී හා සේවා සැපයීමේදී** සන්නිවේදනයේ සාර්ථකත්වය වර්ගීකරණය කිරීමට CFCS ප්‍රයෝජනවත් විය හැක.

උදාහරණ :

1- වෘතිකයන්ට හා වෘතිකයන් නොවූ අයට පොදු වූ බසකින් සන්නිවේදන හැකියාවේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීමට/ විදහා දැක්වීමට,
2- AAC ඇතුළු සියලුම සාර්ථක සන්නිවේදන ක්‍රමවේදයන් හඳුනා ගැනීමට,
3- සන්නිවේදන පරිසරයන්, සගයන් හෝ සන්නිවේදන ඉලක්කයන් වල ඇති විවිධත්වය මත තෝරාගත් මට්ටම වෙනස් විය හැකි ආකාරය සංසන්දනය කිරීමට,
4- පුද්ගලයාගේ සන්නිවේදන සඵලත්වය වර්ධනය කිරීමට ඉලක්ක තෝරා ගැනීම.

★ මට්ටම් පහ පිලිබඳ විස්තර සඳහා පිටු අංක 3 බලන්න
★ මට්ටම් අතර වෙනස හඳුනා ගැනීමට 4 වැනි පිටුවේ ඇති වගුව බලන්න.
★ නිතර අසනු ලබන ප්‍රශ්න සඳහා CFCS වෙබ් අඩවිය බලන්න. http://CFCS.us

## සන්නිවේදන ක්‍රමවේදයන්

සන්නිවේදන ක්‍රමවේදයන් කීයක් භාවිතා කළාද යන්න අදාළ නොවේ. සමස්ථ සන්නිවේදන හැකියාවම සලකා , **CFCS** ක්‍රමවේදය **තුලින් ලබාදෙන්නේ** එක් පොදු **ඇගයීම් මට්ටමකි**. භාවිතා කරනු ලබන සියලු සන්නිවේදන ක්‍රමවේදයන් පහත පෝරමුවේ ලැයිස්තු ගත කල හැක.

මෙම පුද්ගලයා විසින් පහත සඳහන් **සන්නිවේදන** ක්‍රමවේදයන් භාවිතා කරනු ලබයි. *(කරුණාකර අදාළ **සියල්ල** විමසා බලන්න)*

- ☐ කථනය
- ☐ ශබ්ද (උදා. ලෙස "ආ...." යනුවෙන් ශබ්දනගා සගයාගේ අවදානය ලබා ගැනීම)
- ☐ නෙත් යොමුකිරීම, මුහුණේ හැඟීම් ප්‍රකාශනය, අභිනයන් සහ /හෝ ඇඟිල්ල දිගුකර (pointing) (ශරීරයෙන් හෝ දණ්ඩකින් හෝ ලේසරයකින් වැනි යමක් භාවිතයෙන්)
- ☐ හස්ථ මුද්‍රා
- ☐ සන්නිවේදන පොත්, පුවරු සහ /හෝ රූපසටහන්
- ☐ හඬ පිටකරන උපකරණ හෝ කථන ජනක උපකරණ
- ☐ වෙනත්

________________________________________
________________________________________
________________________________________

CFCS සංවර්ධනය පිලිබඳ පරිශීලනයට

Hidecker, M.J.C., Paneth, N., Rosenbaum, P.L., Kent, R.D., Lillie, J., Eulenberg, J.B., Chester, K., Johnson, B., Michalsen, L., Evatt, M., & Taylor, K. (2011). Developing and validating the Communication Function Classification System (CFCS) for individuals with cerebral palsy, Developmental Medicine and Child Neurology. 53(8), 704-710. doi: 10.1111/j.1469-8749.2011.03996.x, PMC3130799.

පරිවර්තනය

ශ්‍යාමනි හෙට්ටිආරච්චි, shyamani@kln.ac.lk, ආබාධිතතා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා සහ සෙරිබ්‍රල් පෝල්සි ලංකා ෆෞන්ඩේෂන්, එරංගි බණ්ඩාර, erangi.bandara@gmail.com, වෘතීය පරිවර්තක, ගෝපි කිට්නසාමි, gopi291975@yahoo.com, නිර්මාතෘ/ අධ්‍යක්ෂක, සෙරිබ්‍රල් පෝල්සි ලංකා ෆෞන්ඩේෂන් ලසන්ති දස්කොන්, ldaskon@gmail.com, ආබාධිතතා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා සහ සෙරිබ්‍රල් පෝල්සි ලංකා ෆෞන්ඩේෂන්

# (CFCS) Cerebral Palsy සෙරිබ්‍රල් පෝල්සි (මස්තිෂ්ක ආඝාතය) සහිත පුද්ගලයින් සන්නිවේදන ක්‍රියාවලියේ වර්ගීකරණ පද්ධතිය

**Key**

**P** CP සහිත පුද්ගලයා

**U** නුපුරුදු සගයා


**F** සුපුරුදු සගයා

━━━━ සාර්ථක

●●●●● අසාර්ථක

## I. නුපුරුදු හා සුපුරුදු සගයකු සමග **සාර්ථක** පණිවිඩ නිකුත් කරන්නෙකු හා ලාභියෙකු


මෙම පුද්ගලයා බොහෝ පුද්ගලයන් සමග බොහෝ පසුබිම් වල ස්වාධිනව පණිවිඩ නිකුත්කරන්නාගේ හා **පණිවිඩ** ලාභියාගේ **භූමිකාව මාරුවෙන් මාරුවට** කරයි. **සුපුරුදු** හා **නුපුරුදු සන්නිවේදන කතා** සගයන් දෙපිරිස සමගම සන්නිවේදනය පහසුවෙන් ඇතිවන අතර **පහසු වේගයකින්** ගලා යයි. සන්නිවේදනයේදී සිදුවන වැරදි වැටහීම් සැනෙකින් මග හරවා ගන්නා අතර පුද්ගලයාගේ සමස්ථ සන්නිවේදනයේ සාර්ථකත්වයට හානියක් ඇතිනොකරයි.




මට්ටම් I හා II අතර වෙනස දෙබස් වේගය මත පදනම් වේ. I මට්ටමේදී පුද්ගලයා විසින් පහසු වේගයකින් සන්නිවේදනය කරයි. පණිවිඩය අවබෝධ කරගැනීමට, ගලපා ගැනීමට, නිවැරදි කිරීමට හෝ වැරදි වැටහීම දුරු කරගැනීමට වැඩි ප්‍රමාදයක් ඇති නොවේ.

## II. නුපුරුදු සහ /හෝ සුපුරුදු සගයන් සමග **සාර්ථක එහෙත්** වේගය අඩුවෙන් පණිවිඩ නිකුත් කරන්නෙකු හා/ **හෝ පණිවිඩ** ලාභියෙකු

විවිධ පුද්ගලයන් සමග විවිධ පසුබිම් වල, පුද්ගලයා ස්වාධිනව පණිවිඩ නිකුත්කරන්නාගේ හා **පණිවිඩ ලාභියාගේ භූමිකාව මාරුවෙන් මාරුවට** කරයි. නමුත් **සන්නිවේදන කතා කරන වේගය අඩු** අතර මේ නිසා සන්නිවේදනය වඩා දුෂ්කර විය හැක. පණිවිඩය තේරුම් ගැනීමට, පණිවිඩය ගලපා ගැනීමට හෝ වැරදි වැටහීම් නිවැරදි කිරීමට එම පුද්ගලයට අමතර කාලයක් අවශ්‍ය විය හැක. සන්නිවේදනයේ වැරදි වටහා ගැනීම් බොහෝවිට දුරුවන අතර මේ නිසා එම පුද්ගලයා **සුපුරුදු හෝ නුපුරුදු සගයන්** සමග කරන සන්නිවේදනයේ සාර්ථකත්වයට එතරම් බාධාවක් ඇති නොවේ.




මට්ටම II සහ III අතර වෙනස පදනම් වන්නේ වේගය හා සන්නිවේදනයට හවුල් වන සගයන් අනුවය. II මට්ටමේදී පුද්ගලයා සියලු සගයන් සමග සාර්ථක නිකුත්කරන්නකු හා ලාභියකු වන නමුත් වේගයේ අඩුපාඩු පවතී. III වන මට්ටමේදී සුපුරුදු සගයන් සමග සාර්ථක සන්නිවේදනය පුද්ගලයාට හැකි වුවත් නුපුරුදු සගයන් බොහෝ දෙනෙකු සමග සාර්ථක නොවේ.

## III. සුපුරුදු සගයන් සමග **සාර්ථකව** පණිවිඩ නිකුත්කරන්නෙකු හා **පණිවිඩ** ලාභියෙකු

සුපුරුදු සගයන් සමග විවිධ පසුබිම් වල, පුද්ගලයා ස්වාධිනව **පණිවිඩ** නිකුත්කරන්නාගේ හා **පණිවිඩ** ලාභියාගේ **භූමිකාව මාරුවෙන් මාරුවට** කරයි. (නුපුරුදු සගයකු සමග නොවේ) නුපුරුදු අය වැඩි දෙනෙකු මග සන්නිවේදනය බොහෝවිට **සාර්ථක නොවේ**. නමුත් **සුපුරුද සගයන් සමග සාමාන්‍යයෙන්** සාර්ථක වේ.

III.




මට්ටම III හා IV අතර වෙනස පදනම් වන්නේ පුද්ගලයකු පණිවිඩ නිකුත්කරනාගේ හා ලාභියාගේ භූමිකාවන් අතර කෙතරම් ක්‍රමවත්ව අඛණ්ඩව මාරුවේද යන කරුණ මතය. III වන මට්ටමේදී පුද්ගලයකු සුපුරුදු සගයන් සමග නිකුත්කරන්නකු හා ලාභියකු ලෙස සාමාන්‍යයෙන් කටයුතු කිරීමට සමත්ය. IV වන මට්ටමේදී පුද්ගලයකු සුපුරුදු සගයන් සමග ක්‍රමවත්ව/ අඛණ්ඩව සන්නිවේදනය නොකරයි. පණිවිඩය නිකුත් කිරීමේදී හෝ ලැබීමේදී අපහසුතා තිබිය හැක.

## IV. සුපුරුදු සගයන් සමග අස්ථාවර පණිවිඩ නිකුත්කරන්නකු හෝ **පණිවිඩ** ලාභියකු

**පණිවිඩ** නිකුත්කරන්නා හා ලාභියා යන භූමිකා අතර මාරුවීම ස්ථාවරව/ඒකාකාරිව දිගින් දිගටම කරගෙන යාමට මෙම පුද්ගලයා අසමත්ය. මේ අකාරයේ අස්ථිර බවක් විවිධ සන්නිවේදකයන් තුල දැකිය හැකිය. එනම්, a) සමහරක් අවස්ථාවල පමණක් සාර්ථක වන නිකුත්කරන්නකු හා ලාභියකු; b) සාර්ථක නිකුත්කරන්නකු වුවත් ලාභියකු ලෙස සීමිතය; c) නිකුත්කරන්නෙකු ලෙස හැකියාව සීමිතය නමුත් සාර්ථක ලාභියකු ලෙසි. **සුපුරුදු සගයන්** සමග සන්නිවේදනය **සමහරක් විට සාර්ථක** විය හැක.

IV.




මට්ටම IVසහ V අතර වෙනස වන්නේ සුපුරුදු සගයකු සමග සන්නිවේදනයේ දුෂ්කරතා වල ප්‍රමාණය අනුවයි. IV මට්ටමේදී පුද්ගලයා පණිවිඩ නිකුත්කරන්නකු හා/හෝ ලාභියකු ලෙස සුපුරුදු සගයන් සමග යම් සාර්ථකත්වයක් ලබයි. V මට්ටමේදී සුපුරුදු සගයන් සමග වුව සන්නිවේදනය සාර්ථක වන්නේ කලාතුරකිනි.

## V. සුපුරුදු සගයන් සමග වුව කලාතුරකින් පමණක් සාර්ථක වන **පණිවිඩ** නිකුත්කරන්නන් සහ **පණිවිඩ** ලාභින්

එම පුද්ගලයට පණිවිඩ **නිකුත්කරන්නකු හා ලාභියකු** ලෙස ඇති හැකියාව සීමිතයි. එම පුද්ගලයාගේ සන්නිවේදනය තේරුම් ගැනීම බොහෝ දෙනෙකුට දුෂ්කරයි. අනෙක් පුද්ගලයන්ගෙන් ලැබෙන පණිවිඩය තේරුම් ගැනීමට එම පුද්ගලයට ඇති හැකියාව සීමිතයි. **සුපුරුදු සගයන් සමග** පවා සන්නිවේදනය සාර්ථක වන්නේ කලාතුරකිනි.

V.



# CFCS මට්ටම හඳුනා ගැනීමේ වගුව

